Human Rights Commission of Sri Lanka
Library
No. 165, Kynsey Road,
Colombo 08.

13

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date    2016.06.20

පැමිණිලිකරු : කේ.එස්. පීරිස් මයා.
ලේකම්.
ශ්‍රී ලංකා වොලිබෝල් ප්‍රවීණයන්ගේ සංගමය.
360. ඇලඩින් පීරිස් මාවත.
මූණගම. හොරණ.

වගඋත්තරකරුවන් : 01 අධ්‍යක්ෂ ජනරාල්.
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව.
09. පිලිප් ගුණවර්ධන මාවත.
කොළඹ 07.

02 සහකාර අධ්‍යක්ෂ.
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව.
09. පිලිප් ගුණවර්ධන මාවත.
කොළඹ 07.

<u>පැමිණිලි අංකය : HRC/2444/15</u>

පැමිණිලිකරු විසින් වගඋත්තරකරුවන්ට එරෙහිව ගොනු කරන ලද පෙත්සම ඉහත අංකය යටතේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ලියාපදිංචි කළ පසු පරීක්ෂණ කටයුතු අවසන් කර පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

**පෙත්සම තුළින් දක්වා ඇති කරුණු :-**

ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය 2015/2017 නිලවරණය සඳහා ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2015.06.05 දින නාමයෝජනා කැඳවන ලද බවත් එම කැඳවීම් ලිපිය අනුව හා 2013.01.15 දිනැති අංක 1793/3 දරණ ගැසට් නිවේදනයේ 13.14 හා 15 යන නියෝගයන්ට අනුව 2015.06.26 දින ප.ව. 200 ට ප්‍රථම ලබාදී ඇති නිවැරදි උපදෙස් මත නාමයෝජනා ඉදිරිපත් කළයුතු වුවත් බොහෝ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165, කින්සි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் / Secretary: 011-2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2689558, 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

නාමයෝජනා ක්‍රීඩා පනතේ නියෝගයන්ට පටහැනිව ඉදිරිපත් කර තිබී ඇති බව පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. පැමිණිලිකරුවන් ඒ සම්බන්ධව ලිඛිතව තම විරෝධතා ඉදිරිපත් කර තිබුණද 2015.07.03 දින පෙ.ව 8.30 ට ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා පැවැත්වූ පරීක්ෂණයේදී පැමිණිලිකරුවන්ගේ විරෝධතා නොසලකා ක්‍රීඩා පනත හා නියෝග උල්ලංඝනය කරමින් පනතට පටහැනිව ඉදිරිපත් කළ අසම්පූරණ නාමයෝජනා පිළිගැනීම නිසා සාධාරණ ලෙස නියෝගයන් අනුකූලව නාමයෝජනා ඉදිරිපත් කළ පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කළබව දක්වා ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

2015.07.10 දින ක්‍රීඩා සංවර්ධන දෙපාරතමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට පෙන්සමට අදාළව වාර්තාවක් ලබාදීමට කොමිෂන් සභාව විසින් දන්වා තිබූ අතර එය 2015.07.30 දිනට පෙර ලබා දෙන ලෙස දන්වා තිබුණද නියමිත දින ඉක්මවා තවත් කෙටි කාලයක් අදාළ වාර්තාව ලබාදීමට වගඋත්තරකරුවන් ඉල්ලා සිටි අතර එම වාර්තාව 2015.08.07 දින කොමිෂන් සභාවට ලැබී ඇත. ඉන් වගඋත්තරකරුවන් දක්වා පහත සඳහන් කරුණු ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ නිලවරණය 1973 අංක 25 දරණ ක්‍රීඩා පනත හා ඊට අදාළ සංශෝධන වලට අනුකූලව සිදු කරන බව පෙන්වා දී ඇත. එම පනතේ 41 වන වගන්තියට අනුව 2013.08.31 දින ප්‍රකාශයට පත් කළ 1825/38 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 54(3) වගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල යටතේ 2015/2017 වර්ෂ වලට නිලධාරීන් තෝරා ගැනීමේ නිලවරණය කැඳවීම හා පැවැත්වීම සිදු කළබව සඳහන් කර ඇත. 2015.05.29 වන දින ප්‍රකාශයට පත් කළ අංක 1916/36 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව එකී නිලවරණය කැඳවීම හා පැවැත්වීමේ බලතල අධ්‍යක්ෂ ජනරාල්වරයාට පවරා ඇති බව දක්වා ඇත. ඒ අනුව වොලිබෝල් සම්මේලනය 2015.07.27 දින ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට කටයුතු යොදා තිබූ බවද සඳහන් කර ඇත.

පුවත්පත් දැන්වීමක් පළ කර අවශ්‍ය තොරතුරු ඕනෑම අයෙකුට ලබාදී තිබී ඇති බවද පත් කර ගැනීමට යෝජිත නිලධාරී මණ්ඩලය සහ ඒ සඳහා නාමයෝජනා එවිය යුතු ආකෘති පත්‍රයද නාම යෝජනා බාර ගන්නා අවසන් දිනය හා වේලාවද ඉදිරිපත් කළයුතු ආකාරය හා විස්තරද සඳහන් ලිපියක් අදාළ අනුබද්ධිත ආයතන වලටද යවා ඇති බව වාර්තාවේ ඇමුණුම් මගින් පෙන්වා දී ඇත. ඡන්දය භාවිතා කිරීම හා නියෝජිතයින් පත් කිරීම සම්බන්ධව ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය තම අනුබද්ධ වොලිබෝල් සංගම් 67 ක් වෙත මෙම වාර්තා ලිපි මගින් දැනුවත් කර ඇති බවද පෙන්වා දී ඇත. 2015.06.26 දින ප.ව. 2.00 ට පෙර නිලවරණය සඳහන් නාම යෝජනා බාර දියයුතු බව වගඋත්තරකරුවන් පෙන්වා දී ඇත. පසුව එම නාම යෝජනා එදින ප.ව. 2.00 ට පැමිණ සිටි ක්‍රීඩා

සමාජ නියෝජිතයින් ඉදිරිපිටදී විවෘත කොට ප්‍රකාශයට පත් කරන බවද විරෝධතා ඉදිරිපත් කිරීමට එදින සවස 5.00 වන තෙක් අවස්ථාව ලබාදී තිබූ බවද මෙම ක්‍රියාවලිය සියලුම ක්‍රීඩාවන් සඳහා ක්‍රියාත්මක කර තිබූ බවද වගඋත්තරකරුවන් විසින් දක්වා ඇත.

ලැබී තිබූ විරෝධතා අතර මෙම පැමිණිලිකරුගේ විරෝධතාවයක් ද තිබූ බව දක්වා සිටින වගඋත්තරකරුවන් ඒ අනුව පැමිණිලිකරු හා වගඋත්තරකරු 2015.07.03 දින උදෑසන 8.30 ට ගෙන්වා පරීක්ෂණයක් පවත්වන ලද බවද, එම පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් ලෙස අධ්‍යක්ෂ ජනරාල් වූ කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර මහතා ද සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ වූ ආර්.බී. වික්‍රමසිංහ මහතා ද පුහුණුකරු වශයෙන් සිටි සුහානි උඩවත්ත මහත්මිය ද කටයුතු කළබව පෙන්වා දී ඇත. කමිටුව ගන්නා ලද තීරණ පහත පරිදි බව වැඩිදුරටත් සඳහන් කර ඇත. එනම්

01 සභාපති ධූරය සඳහා නාමයෝජනා ඉදිරිපත් කළ ඩබ්.පී.එස්. එරන්දික මහතා ක්‍රීඩකයෙකු නොවන බැවින් ක්‍රීඩා අමාත්‍යවරයාගේ අනුමැතිය එවිට අවශ්‍යව තිබීම ප්‍රධාන කොන්දේසියක් වීම මත විරෝධතාවය දක්වා තිබුණේ ක්‍රීඩා අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව නාම යෝජනා ඉදිරිපත් කළ බවය. 2015.06.18 දින අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා එරන්දික මහතා තම ඉල්ලීම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබූ බවද ඒ අනුව කමිටුව විසින් ඔහුට තරග කිරීමට අවස්ථාව ලබාදීම නිර්දේශ කළ බැවින් පැමිණිලිකරුගේ විරෝධතා නොසලකා හරින ලද බවද සඳහන් කර ඇත. එම නිර්දේශය ඇමතිවරයාට ඉදිරිපත් කරන ලද්දේ ද අමාත්‍යවරයාගේ අනුමැතිය ලද පසු එය අනුමත කළ බවට ලිපියක් එරන්දික මහතාට ඉදිරිපත් කරන ලද්දේ ද ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින්ය. නාම යෝජනා විවෘත කරන ලද අවස්ථාව වනවිට ක්‍රීඩා අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී නොතිබුණද එම ලිපිය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබීම මත පනතේ 14 වගන්තිය යටතේ ඔහුට ඉල්ලීමට අවස්ථාවක් ලබා දුන් බව සඳහන් කර ඇත.

02 ලේකම් තනතුර සඳහා ජ්.ජ්.එස්. නාලක මහතා විසින් ඉදිරිපත් කර තිබූ නාම යෝජනාවට එරෙහිව ඉදිරිපත් කර තිබූ විරෝධතාවය වන්නේ සහතික පත්‍ර 3 ක් අමුණා නොමැති වීම බව පෙන්වා දී ඇත. ඒ පිළිබඳ සලකා බැලීමේදී පනතේ 14 වගන්තිය අනුව මෙම නාලක යන අය තරග 3 ක් සඳහා ඉදිරිපත් වී ඇති බව අමුණා ඇති සහතික පත්‍ර මගින් සනාථ වන බැවින් හා වෙනත් තරග වලට සහභාගි වී ඇති බව විරෝධතා පරීක්ෂණයේදී තහවුරු වී ඇති බැවින් ඔහුට අවස්ථාව ලබාදී ලද විරෝධතා නොසලකා හරින ලද බව වාර්තාවෙන් දක්වා ඇත.

03 පිටියේ ලේකම් තනතුර සඳහා නාමයෝජනා ඉදිරිපත් කළ එස්.ඩබ්.එම්.ඩූ. චන්දන මහතා ඉදිරිපත් කළ නාමයෝජනාවට විරෝධතා දක්වා තිබූ බවද, එක සහතිකයක් පමණක්

ඉදිරිපත් කර සුදුසුකම් දක්වා නාමයෝජනා ඉදිරිපත් කිරීම මත විරෝධතා දක්වා තිබූ බවද, නමුත් ඔහු තරග 3 කට වඩා ඉදිරිපත්ව තිබූ බව පරීක්ෂණයේදී තහවුරු වූ බවද විරෝධතා ප්‍රතික්ෂේප කර නාමයෝජනා ඉදිරිපත් කිරීමට ඉඩ දුන්නද නිලවරණයේදී තම නාමයෝජනාව ඉල්ලා අස් කර ගන්නා ලද බවද පෙන්වා දී ඇත.

මේ අනුව වෙනත් විරෝධතා නිර්ණාමිකව ඉදිරිපත් කළ බැවින් ඒවා ප්‍රතික්ෂේප කර ඉහත පරිදි කටයුතු කිරීමට තීරණය කර තිබූ බව වගඋත්තරකරුවන් විසින් පෙන්වා දී තිබේ.

**පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-**

**2015.10.02** දින සිනාසි ප්‍රකාරව දෙපාර්ශවය කොමිෂන් සභාව වෙත කැඳවා පරීක්ෂණ කටයුතු සිදු කර ඇත. එම පරීක්ෂණය සඳහා පැමිණිලිකරු සමග වොලිබෝල් ක්ෂේත්‍රයට අදාළව කරුණු දැක්විය හැකි පාර්ශවයන් ලෙස ජේ.ජේ. ජයතිස්ස මහතා ද ආරියදාස ලියනගේ මහතා ද මධූකා කිරිඇල්ල මහත්මිය ද පෙනී සිට ඇත. වගඋත්තරකරු වෙනුවෙන් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක ආර්.බී. වික්‍රමසිංහ මහතා ඉදිරිපත් වී ඇත.

වගඋත්තරකරු විසින් මින් පෙර එවා ඇති වාර්තාවේ සඳහන් කරුණු තමාගේ ගොනුවේ ඇති කරුණු සමග සලකා බලා වාචිකව කරුණු පැහැදිලි කර දීමක් සිදු කර ඇත. ජාතික මට්ටමේ ක්‍රීඩා හා තරග වෙනුවෙන් ඉදිරිපත් නොවූ අයෙකු සභාපති ධූරය සඳහා තරග වදින්නේ නම් ක්‍රීඩා අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය අවශ්‍ය බව ශ්‍රී ලංකා වොලිබෝල් සංගමයේ සභාපති ධූරය සඳහා නාමයෝජනා බාර ගැනීමේදී අදාළ අයදුම්පත් කැඳවූ ගැසට් පත්‍රයේ නීතිරීති හා කොන්දේසි අනුව නිරීක්ෂණය වේ. වගඋත්තරකරු සඳහන් කර ඇත්තේ අමාත්‍යවරයාගේ නිර්දේශය දෙපාර්තමේන්තුවට පසුව ලැබී තිබුණු බවත් නාමයෝජනා බාර ගන්නා අවස්ථාව වනවිට අමාත්‍යවරයාගේ නිර්දේශය ලැබී නොතිබුණු බවත්ය. නමුත් එම නිර්දේශය දෙපාර්තමේන්තුව තුළ තිබූ බව තමා දන්නා බැවින් විරෝධතා දක්වා තිබූ නාම යෝජනාව නිලවරණය සඳහා භාර ගන්නා ලද බවට සඳහන් කර ඇත.

ශ්‍රී ලංකා වොලිබෝල් ප්‍රවීණයන්ගේ සංගමයේ ලේකම් වන මෙම පැමිණිලිකරු වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම් වලට එරෙහිව තම කරුණු දැක්වීම් ලිඛිතව ගොනුවට ලබා දී ඇත. ඉන් දක්වා ඇත්තේ නාමයෝජනා විවෘත කිරීමේදී ඉල්ලා ඇති කොන්දේසි සපුරා නොමැති සියලු නාමයෝජනා ප්‍රතික්ෂේප කළයුතු බවට වේ. ව්‍යවස්ථාපිත විධිවිධාන වලට පටහැනිව ඉදිරිපත් කළ නාමයෝජනා පිළිබඳව විරෝධතා දක්වා තිබුණද එය නොසලකා හැර කටයුතු කර තිබීම මෙම පෙත්සම ගොනු කිරීමට හේතුවූ බව පෙන්වා දී ඇත. ලිඛිතව විරෝධතා දක්වා ඇතත් මෙම නාමයෝජනා පිළිගැනීමට කටයුතු කිරීමට හේතු තමාට ලිඛිතව ලබාදී නැති බව පැමිණිලිකරු පෙන්වා දී ඇත.

වගඋත්තරකරුවන් තම බලය අභිබවා කටයුතු කර ඇති බැවින් කොමිසන් සභාවේ පරීක්ෂණ කටයුතු අවසන් කර පෙන්සමෙන් ඉල්ලා ඇති සහන ලබා දෙන ලෙසට පැමිණිලිකරු විසින් ඉල්ලා සිට ඇත.

**නිරීක්ෂණ :-**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලන නිලවරණය පවත්වන්නේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනත හා ඊට අදාළ සංශෝධන පනත් වල නීතිරීති යටතේ බව අනාවරණය වී ඇත. පනතේ 41 වගන්තිය අනුව නිකුත් කළ අතිවිශේෂ ගැසට් පත්‍රය වූ 2013.08.31 දිනැති අංක 1825/38 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 54(3) වගන්තිය අනුව ක්‍රීඩා අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල යටතේ මෙම නිලවරණය පැවැත්වීම 2015.05.29 දින සිදු කිරීමට ප්‍රකාශයට පත් කර එකී බලය 1916/36 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරා ඇති බවද අනාවරණය වී ඇත. 2015.07.27 දින පෙ.ව. 9.00 ට ක්‍රීඩා අමාත්‍යාංශයේදී මෙම නිලවරණය පවත්වා ඒ සඳහා අදාළ විරෝධතා තිබේ නම් 2015.06.26 දින ප.ව. 5.00 ට පෙර භාරදීමට දන්වා ඇති අතර පැමිණිලිකරුවන් ඒ අනුව තම විරෝධතා දක්වා ඇත. විරෝධතා සම්බන්ධව 2015.07.03 දින දෙපාර්ශවය කැඳවා පරීක්ෂණ සිදු කළද වගඋත්තරකරුවන් විසින් එකී විරෝධතා ප්‍රතික්ෂේප කර එම නාමයෝජනා භාර දුන් තැනැත්තන් හට නිලවරණයට ඉදිරිපත් වීමට අවස්ථාව ලබාදී ඇත. නමුත් ක්‍රීඩා පනතේ ඇති ප්‍රතිපාදන හා වෙනත් ඒ හා සමාන රෙගුලාසි අනුව නිලවරණය සඳහා ඉදිරිපත් වියහැක්කේ නාමයෝජනා භාර දුන් පසු ඒ සඳහා සුදුසුකම් ලත් තැනැත්තන් හට පමණි. නාම යෝජනා සඳහා සුදුසුකම් නොලත් අය සිටී නම් ඒවා ප්‍රතික්ෂේප කිරීමේ බලය ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයාට තිබී ඇත.

නිලවරණය යෙදී තිබී ඇත්තේ 2015.07.27 දිනට වන අතර නාමයෝජනා කැඳවීම 2015.06.05 දින සිට ආරම්භ කර ඇති බවත් නාමයෝජනා භාර ගැනීම 2015.06.26 දින ප.ව. 2.00 ට අවසන්ව එදින ප.ව. 5.00 වන තෙක් විරෝධතා සලකා බලා ඇති බවත් නිරීක්ෂණය වී ඇත. එදින ප.ව. 2.15 ට ලැබුණු රොහාන් සෝමවංශ නමැති අයෙකුගේ නාම යෝජනාව පැවති නීතියට අනුව අවලංගු කර තිබුණේ එය එදින ප.ව. 2.00 ට පෙර ලබා දී නොතිබුණු බැවින් වන බවද නිරීක්ෂණය වේ.

සභාපති ධූරය සඳහා නාමයෝජනා ඉදිරිපත් කළ ජේ.එම්.යූ. ජයන්දික නම් මහතා ක්‍රීඩකයෙකු නොවන බැවින් 2013.01.15 දිනැති අංක 1793/3 ගැසට් නිවේදනයේ 14 වන රෙගුලාසිය අනුව ක්‍රීඩා අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අවසරයක් සහිතව තම නාම යෝජනා පත්‍රය භාර දියයුතු වුවද අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය නාමයෝජනා භාර ගන්නා අවසන් මොහොතට පෙර ඉදිරිපත් කර තිබී නොමැත. ඒ බව වගඋත්තරකරුවන් ද තම වාර්තාවෙන් පිළිගනිමින් සඳහන් කර ඇත්තේ

**"නාමයෝජනා විවෘත කරන ලද අවස්ථාව වනවිට ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගේ අනුමැතිය ඉල්ලුම්කරුට ලැබී නොතිබුණද එම ලිපිය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබී විසා අංක 14 වගන්තිය යටතේ ඔහුට ඉල්ලීමට අවස්ථාව ලබා දෙන ලදී"** ලෙසය.

නාමයෝජනා කැඳවීමේදී වගඋත්තරකරුවන් දක්වා ඇති ලේඛන අනුව සඳහන් කර ඇත්තේ, "සුදුසුකම් සනාථ කිරීමේ ලියකියවිලි ඉදිරිපත් නොකරන හෝ ක්‍රීඩා පනතේ විධිවිධාන අනුව නුසුදුසුකම් ඇති හෝ ජාතික සංගමයේ ව්‍යවස්ථාවට අනුකූල නොවන හෝ අදාළ ආකෘති පත්‍රය නිවැරදිව සම්පූර්ණ නොකරන ලද නාමයෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබේ" ලෙසය:

ඒ අනුව ක්‍රීඩා පනතේ ඇති ප්‍රතිපාදන හා ක්‍රීඩා පනතට සමගාමීව වොලිබෝල් නිලවරණය සඳහා රෙගුලාසි ඇතුළත් 1916/36 දරණ හා 1825/38 දරණ අතිවිශේෂ ගැසට් පත්‍ර තුළද ඇති නීතිරීති වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බව අනාවරණය වේ. සභාපති හා ලේකම් තනතුරු සඳහා සලකා බැලිය යුතු විරෝධතා සලකා බැලීමේදී ඒ වෙනුවෙන් පත් කළ කමිටුව නිවැරදි ලෙස විරෝධතා සලකා බලා නැති බවද මින් නිරීක්ෂණය වේ. ක්‍රීඩා පනතේ විධිවිධානයන්ට යටත්ව ක්‍රීඩා අමාත්‍යවරයා විසින් එයට අනුව නිකුත් කළ ඉහත කී අතිවිශේෂ ගැසට් පත්‍රයන්හි නියෝග නොසලකා හැර එකී නීතිමය වගන්තීන් තුළ ඇති ව්‍යවස්ථාපිත නීතිය උල්ලංඝනය කරමින් නාමයෝජනා බාර දෙන දිනට සුදුසුකම් සපුරා නොතිබූ අයදුම්පත් බාරගෙන නිලවරණය සඳහා ඉඩ ලබා දෙන්නේ වෙනත් කුමන නීතියක් යටතේ ද යන්න පැහැදිලි කිරීමට වගඋත්තරකරුවන් හා විරෝධතා පරීක්ෂණ කමිටුව සමත්ව නොමැත. ක්‍රීඩා පනතේ ඇති ව්‍යවස්ථාපිත නීතීන් උල්ලංඝනය කිරීමට වගඋත්තරකරුවන්ට හැකියාවක් තිබිය නොහැක. පනතේ ව්‍යවස්ථාපිත නීතියට අනුව හා එයට අනුව නිකුත් කළ ගැසට් ගත රෙගුලාසිද උල්ලංඝනය කිරීමට වගඋත්තරකරුවන් කටයුතු කිරීම අනුව පැමිණිලිකරුවන් නවදුරටත් තම මූලික අයිතිවාසිකම් කඩවූ බවට දක්වා මෙම පෙත්සම ගොනු කරන්නේ වගඋත්තරකරුවන්ගේ පරිපාලන හා විධායක ක්‍රියාවන් තුළින් සිදුව ඇති නීතියේ ඇති සර්ව සාධාරණ වූ අයිතිවාසිකම අහිමිව යාම හේතුවෙනි.

**නිගමනය :-**

ඉහත කරුණු අනුව වගඋත්තරකරුවන් විසින් 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතේ ඇති වගන්තීන් හා එයට අනුව ප්‍රකාශයට පත් කළ 2013.01.15 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1793/3 හි 13.14 හා 15 වන ඡේදයන්හි දැක්වෙන ව්‍යවස්ථාපිත නීතීන් උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකා වොලිබෝල් සංගමය සඳහා වූ නිලවරණයේ නාමයෝජනා බාර ගැනීමේදී ක්‍රීඩා පනතේ විධිවිධාන අනුව නුසුදුසුකම් ඇති නාමයෝජනා බාර ගැනීමෙන් පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කළ බවට දක්වා ගොනු කරන ලද මෙම පෙත්සමේ කරුණු තහවුරු වී ඇති බවද ඒ අනුව වගඋත්තරකරුවන්

විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව වගඋත්තරකරුවන් විසින් ක්‍රීඩා පනතට පටහැනි ලෙස පවත්වන ලද නිලවරණය අවලංගු කර ශ්‍රී ලංකා වොලිබෝල් සංගමය සඳහා වූ නිලවරනයේ නාමයෝජනා නිවැරදි ලෙස ක්‍රීඩා පනතට අනුව නැවත කැඳවා සභාපති සහ ලේකම් ධූරය හා වෙනත් තනතුරු සඳහා සුදුස්සන් තෝරා ගැනීමට අවශ්‍ය කටයුතු කළයුතු බවට මින් නිර්දේශ කරනු ලැබේ.

අවසාන වශයෙන් මෙවැනි පරිපාලනමය අකටයුතු/අසාධාරණකම් සඳහා පාර්ලිමේන්තු කටයුතු පිලිබඳ කොමසාරිස්වරයාගේ (ඔම්බුඩ්ස්මන්වරයාගේ) කාර්යාලය මගින් හෝ 3වී ආඥාවක් මගින් සහන/ප්‍රතිකර්ම අයදීම වඩා සුදුසු වන බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කරන බවද දන්වමු.

2016.07.29 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/..

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka